Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තුන්වන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

# නර්තනය

කාලය පැය 2

නම / විභාග අංකය:

**I කොටස**

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. පා සරඹවල සුරල් අඩිය යනුවෙන් හඳුන්වන්නේ,
    (i) අටවන පා සරඹය (ii) දොළොස්වන පා සරඹය
    (iii) එකොළොස්වන පා සරඹය (iv) හත්වන පා සරඹය

02. තකට තකට තක තරිකිට කුංදත් /// ගජිං යනු,
    (i) අටවන ගොඩ සරඹයේ කස්තිරම (ii) හයවන ගොඩ සරඹයේ කස්තිරම
    (iii) නවවන ගොඩ සරඹයේ කස්තිරම (iv) හත්වන ගොඩ සරඹයේ කස්තිරම

03. දෝං ජිං ජිං තකට දොංතක ... බෙර පදයට අදාළ තාල රූපය වන්නේ,
    (i) ^123 / ´1234 (ii) ^12 / ´123
    (iii) ^12 / ´1234 (iv) ´1234 / ´1234

04. ''දුරත් බැලුම නොව ළඟත් බලන අය ...'' යන කවි පදය ඇතුළත් වන්නේ,
    (i) තුරංගා වන්නම (ii) වෛරොඩි වන්නම
    (iii) සිංහරාජ වන්නම (iv) හනුමා වන්නම

05. තබ්ලාව සහ සර්පිනාව (හාර්මෝනියම්) භාවිත වන භාරතීය නර්තන සම්ප්‍රදාය වන්නේ,
    (i) මනිපුරි (ii) කථකලි
    (iii) භරත (iv) කථක්

06. දේශීය නර්තන කලාවට විශාල මෙහෙවරක් කිරීම වෙනුවෙන් 1986 දී ජනාධිපතිවරයා අතින් කලාභූෂණ සම්මානය හිමිකර ගත් නර්තන ශිල්පියා වන්නේ,
    (i) විල්සන් ඔලබොඩුව ගුරුතුමා (ii) අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා
    (iii) පණීභාරත ගුරුතුමා (iv) චිත්‍රසේන ගුරුතුමා

07. ''කැලෑමල්'' සහ ''දෙපානෝ'' යන ගීත නාටක නිර්මාණය කරන ලද ශිල්පීන් වන්නේ,
    (i) ප්‍රේමසිරි කේමදාස මහතා සහ මකුලොළුව මහතා (ii) සරච්චන්ද්‍ර මහතා සහ මකුලෝළුව මහතා
    (iii) මකුලොළුව මහතා සහ ප්‍රේමසිරි කේමදාස මහතා (iv) ප්‍රේමසිරි කේමදාස මහතා සහ සරච්චන්ද්‍ර මහතා


08. දේශීය නාට්‍ය සම්ප්‍රදායන් අතරින් අතිශෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය වර්ගය වන්නේ,
    (i) තාත්වික නාට්‍ය (ii) ගීත නාට්‍ය
    (iii) මුද්‍රා නාට්‍ය (iv) ශෛලිගත නාට්‍ය

09. නර්තන කලා ඉතිහාසය පිරික්සීමේදී '' නටන ගහපතියාගේ දුව ...'' සහ ''දේවදාසීන් හත්දෙනෙකු පිදූ බව ...''යන ප්‍රකාශ දෙක පිළිවෙළින් සඳහන් යුග දෙක වන්නේ,
    (i) පොළොන්නරු යුගය සහ අනුරාධපුර යුගය (ii) ගම්පොළ යුගය සහ කෝට්ටේ යුගය
    (iii) අනුරාධපුර යුගය සහ පොළොන්නරු යුගය (iv) පොළොන්නරු යුගය සහ ගම්පොළ යුගය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. ස්වස්ථතාව කෙරෙහි බලපාන සාධකයන්ගෙන් මානසික සාධකයක් වන්නේ,
   (i) නිරෝගී ශරීරයක් පවත්වාගෙන යාම   (ii) චිත්තවේගවල සමබරතාවය
   (iii) මාංශපේශිවල ක්‍රියාකාරිත්වය සහ සමබරතාවය   (iv) ශරීරයේ නම්‍යශීලිබව පවත්වා ගැනීම

● **අංක 11-15 දක්වා ප්‍රශ්නවලට ප්‍රහේළිකාව තුළින් පිළිතුරු සපයන්න.**




**හරහට**

11. උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මයේ පුද ලබන දෙවියෙකි.
12. ගොයම් නැටුම සඳහා වාදනය කරන භාණ්ඩයකි.

**පහළට**

13. සුෂිර වාද්‍ය භාණ්ඩයකි.
14. පළමු ගොඩ සරඹය මෙනමින් හඳුන්වයි.
15. ''බැනුම් අහන්නට වෙයි දැන ගන්නේ'' මෙම කවි පදය අයත් ගැමි නැටුම වන්නේ

● **අංක 16-20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහනින් තෝරා ලියන්න.**

**(සුරත්තට්ටුව / පහන් මඩුව / ආර්. මුත්තුසාමි / නවාබ් වජීඩ් අලීෂා / මහා වංශ ටීකාව)**

16. 1955 දී නිෂ්පාදනය වූ මාතලන් චිත්‍රපටයේ සංගීතය නිර්මාණය කරන ලද්දේ ....................................... විසිනි.
17. ගැටබෙරයෙහි දකුණු ඇස ආරක්ෂා කිරීම සඳහා ....................................... යොදා ගනී.
18. .......................................19 වන ශත වර්ෂයේ දී ලක්නව් සරානාව ආරම්භ කරන ලදි.
19. ....................................... විෂ්ණු, සමන් දෙවියන් හා සම්බන්ධ වේ.
20. දේශීය පංචතූර්ය වාදනය පිළිබඳව සඳහන් වන්නේ ....................................... .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නර්තනය - 9 ශ්‍රේණිය

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

- පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

**01. තාලය ගායනයට මෙන්ම නර්තනයට ද අත්‍යවශ්‍ය වේ.**

(i) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 03)

(ii) මාත්‍රා 2 + 3 තාල රූපයට අදාළ කවි පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 03)

(iii) මාත්‍රා 4 + 4 තාල රූපයට අයත් කස්තිරමක් ප්‍රස්තාර කරන්න. (ල. 04)

**02. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

(i) ගැමි නැටුම්

(ii) සතර බීජාක්ෂර

(iii) පංචතූර්ය වාද්‍ය භාණ්ඩ

(iv) අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා (ල. 5×2=10)

**03. කිසියම් පුද්ගලයකුගේ කායික, මානසික සුවය මුල්කොටගෙන ශාන්තිකර්ම පවත්වනු ලැබේ.**

(i) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන ශාන්තිකර්ම තුනක් දක්වන්න. (ල. 03)

(ii) උඩරට ප්‍රධාන ශාන්තිකර්මය පැවැත්වීමට හේතු වූ කරුණු තුනක් දක්වන්න. (ල. 03)

(iii) පහතරට ප්‍රධාන ශාන්තිකර්මයෙන් සමාජයට ලබා දෙන ආගමික ආකල්ප පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 04)

**04. ඉන්දියාවේ පාරම්පරිකව පැවත එන නර්තන සම්ප්‍රදායන් පවතී.**

(i) කථක් නර්තන සම්ප්‍රදායේ ඔබ උගත් ඝරානා (ගුරුකුල) තුනක් නම් කරන්න. (ල. 03)

(ii) කථක් නර්තන අංග තුනක් නම් කරන්න. (ල. 03)

(iii) කථක් නර්තනය ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙක් නම් කර ඔහු පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 04)

**05. නාට්‍ය යනු යමක්කර පෙන්වීම බව සරලවම හැඳින්විය හැකිය.**

(i) දේශීය නාට්‍ය ශෛලීන් කීයද? ඒවා නම් කරන්න. (ල. 03)

(ii) මුද්‍රා නාට්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 03)

(iii) දේශීය මුද්‍රා නාට්‍ය ශිල්පීන් දෙදෙනෙක් නම් කර ඔවුන් විසින් නිර්මාණය කළ නාට්‍ය එක බැගින් නම් කරන්න. (ල. 04)

**06.** ගීතයට අනුව නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ දී අවධානය යොමු කළ යුතු අංග පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල.10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තුන්වන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

# නර්තනය

පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (ii) | 06. | (ii) | 11. | කොහොඹා | 16. | ආර්. මුත්තුසාමි |
| 02. | (iii) | 07. | (i) | 12. | බුම්මැඩිය | 17. | සුරත්තට්ටුව |
| 03. | (i) | 08. | (iv) | 13. | කොම්බුව | 18. | නවාබ් වජිඩ් අලීෂා |
| 04. | (iii) | 09. | (iii) | 14. | අඩිය | 19. | පහන් මඩුව |
| 05. | (iv) | 10. | (ii) | 15. | පන් | 20. | මහාවංශ ටීකාව |

(ල.1×20=20)

## II කොටස

01. (i)

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | කුං | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොම් | - | ත | ක |

(ල. 03)

(ii) අදාළ තාල රූපයට කවි පදයක් නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් (ල. 03)

(iii)



(ල. 04)

02. ⋆ සිසුවා තෝරා ගන්නා ලද මාතෘකා දෙකට අදාළව අවම වශයෙන් කරුණු හතරක්වත් ඇතුළත්ව විස්තර කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු හිමි වේ. (ල. 10)

03. (i) උඩරට නර්තන සම්ප්‍රදාය - කොහොඹා කංකාරිය
පහතරට නර්තන සම්ප්‍රදාය - දෙවොල් මඩුව
සබරගමු නර්තන සම්ප්‍රදාය - පහන් මඩුව (ල. 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ii) කොහොඹා කංකාරි ශාන්ති කර්මය

1. පඬුවස්දෙව් රජුට වැදුනු දිවි දෝෂය නිසා හටගත් රෝගය සුවපත් කිරීම
2. ධන ධාන්‍ය, ගව මහේෂාදී භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම
3. පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුවකර ගැනීම
4. අධ්‍යාපනික අවශ්‍යතා සඳහා .. ආදී ලෙසින් කරුණු දක්වා ඇත්නම් ... (ල. 03)

(iii) දෙවොල් මඩුව ශාන්තිකර්මය

1. වෛරය, ද්වේශය, ක්‍රෝධය දුරු කිරීම
2. දෙවියන් පිළිබඳ විශ්වාස හා ඇදහිලි
3. බෞද්ධාගාම ස්ථාපිත රටක් වූ ශ්‍රී ලංකාවේ කැලණියට ගොස් බුදුන් වැඳීම
4. සාමුහිකත්වය ... ආදී ලෙසින් කරුණු දක්වා ඇත්නම් (ල. 04)

04. (i)

1. ලක්නව් සරානා
2. ජායිපූර් සරානා
3. බෙනාරිස් සරානා
4. රායිගර් සරානා (ගුරුකුල තුනක් ලියා ඇත්නම් ...) (ල. 03)

(ii) **කථක් නර්තන අංග**

1. භූමි වන්දනා 2. ආමද් 3. සලාම් 4. බෝල් 5. පරන් (ල. 03)

(iii)

1. නවාබ් වජිඩ් අලීෂා රජු
2. චක්‍රධාර් සින්ග් රජු
3. අච්චන් මහාරාජ්
4. බිර්ජු මහාරාජ් (එක් ශිල්පියෙකු නම් කොට ඔහු පිළිබඳව කෙටියෙන් හඳුන්වා ඇත්නම් ...) (ල. 04)

05. (i)

1. 2 (දෙකයි)
2. i. ලෝක ධර්මී නාට්‍ය ශෛලිය ii. නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලිය (ල. 03)

(ii) මුද්‍රා නාට්‍ය පිළිබඳ කෙටියෙන් හඳුන්වා ඇත්නම් ... (ල. 03)

(iii)

1. චිත්‍රසේන මහතා - කරදිය, නලදමයන්ති, චණ්ඩාලිකා, ශිවරංග
2. වජිරා මහත්මිය - හිම කුමාරි, රන් කිකිළි
3. ප්‍රේමකුමාර එපිටවල මහතා - සැළලිහිණි, පරෙවිය, ගමන
4. එස්. පනීභාරත මහතා - සත්පත්තිනි, ග්‍රහ අපලය
5. ඉඹුල්ගොඩ මහතා - උදාව, රන්දද (ල. 04)

06. සිසුවා නිර්මාණශීලිව ප්‍රශ්නයට අදාළ ලෙස කරුණු දක්වා ඇත්නම් (ල.10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තුන්වන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 09 - 2023

# නර්තනය

ප්‍රායෝගික පරීක්ෂණය

01. (i) කැමති ගායනය
(ii) නම් කරන ලද ගායනය
(කඩතුරා / පන් / ගොයම් / සොකරි)
(iii) 2 + 3 / 3 + 4 / තාල රූපයට අයත් බෙරපදයක් තාල තබා කීම
(iv) කැමති බෙර සරඹයක් වාදනය කිරීම
(v) මාත්‍රා 4 + 4 තනි තිතට අයත් බෙරපදය වාදනය කිරීම (ල.2×5=10)

02. ⋆ ගොඩ සරඹ - 7, 8, 9 ගොඩ සරඹ වලින් නම් කරන ලද එකක් නර්තනය කොට ඊට අදාළ කස්තිරම නර්තනය කරන්න. (සරඹය = 5 කස්තිරම = 5) (ල.5×2=10)

03. ⋆ සිංහරාජ වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරන්න. (ල. 10)

04. (i) **ගීත අනුව නර්තනය**
රන්වන් දුන් කරලින් පැසිලා / අක්කේ අක්කේ අර ... ගීත වලින් කැමති ගීතයක් නර්තනය කරන්න.
(ii) **ගැමි නැටුම් නර්තනය**
(පන් / ගොයම්) කැමති ගැමි නැටුමක් නර්තනය කරන්න. (ල.5×2=10)

05. **චරිත නිරූපනය**
⋆ සතුටින් නටන මොණරා උගුලකට අසුවීම ...
⋆ දරුවන්ගේ අහිමිවීම දරාගත නොහැකිව වැලපෙන පටාචාරා ...
⋆ මාළු ඇල්ලීමට දියඹට යන ධීවරයෙකුගේ ඔරුව මුහුදුබත් වේ ... (ල. 10)

(මුළු ලකුණු =50)